# <u>*ජුවෙල්ස් 2011 - ප්‍රවෘත්ති නිවේදනය*</u>

ශ්‍රී ලංකාවේ මැණික් ක්ෂේත්‍රය තුළ පුරෝගාමී විද්වත් ආයතනය වන ශ්‍රී ලංකා රත්නවිද්‍යාඥයින්ගේ සංගමය ලාභ නොලබන අධ්‍යාපනික හා වෘත්තියමය ආයතනයක් වන අතර ඔවුන් වසරක් පාසා පවත්වන ප්‍රදර්ශනය මෙවරද "ජුවෙල්ස් 2011" නමින් දෙසැම්බර් මස 17 සහ 18 දෙදින තුල බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්වේ. මෙම ප්‍රදර්ශණය මැණික්, ඛනිජ වර්ග, ආභරණ සහ රත්නවිද්‍යාත්මක උපකරණ වලින් සමන්විත වන අතර ප්‍රධාන අරමුණ වන්නේ මැණික් හා සම්බන්ධ විවිධ පැතිකඩයන් පිළිබඳ ජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීමයි.

මේ හා සමගාමීව මෙම වසරේදී ද හොඳම ඔප දමන ලද මැණික් ගල, මැණික් එබ්බවූ ආභරණය, මැණික්මය ස්ඵටිකය සහ රත්නවිද්‍යාත්මක ඡායාරූපය තේරීමේ තරඟාවලියක් ද පැවැත්වේ.

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මෙවරද ප්‍රධාන දායකත්වය සපයමින්, රත්නවිද්‍යාඥයින්ගේ සංගමයේ මුඛ්‍ය පරමාර්ථය වන විද්‍යාත්මක පතපොතින් පරිබාහිරව මැණික් ක්ෂේත්‍රය හා රත්නවිද්‍යාව පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාවට තත්කාලීන අත්දැකීම් ලබා දීම වෙනුවෙන් උපකාරී වේ.

ජුවෙල්ස් 2011 ඔබ හට එක වහලක් යට දී සියළුම වර්ග වල මැණික් හා ස්වර්ණාභරණ නැරඹීමටද මිලදී ගැනීමට ද හැකි වන අතර මැණික් තාප පිරියම් කිරීම නූතන හා සාම්ප්‍රදායික මැණික් කැපීම ආදිය දැක ගැනීමේ දුර්ලභ අවස්ථාවද හිමි වේ.

මෙහි විශේෂතම අංගය වන්නේ රුපියල් 100යේ සෑම ඇතුල්වීමේ ප්‍රවේශ පත්‍රයක් සමඟම වටිනා මැණිකක් ත්‍යාග වශයෙන් ලබා දීමයි. ඒ සඳහා සංගමය විශාල මුදලක් වැය කරන අතර එහි අරමුණද මැණික් පිළිබඳ ජනතාවතුළ උනන්දුව සහ දැනුම වැඩි කිරීම වේ.

පසුගිය වසර වලදී ලද සාර්ථක අත්දැකීම් හේතුවෙන් මෙම වසරේ ප්‍රදර්ශනය සඳහා ද මැණික් පිළිබඳ උනන්දුවක් දක්වන්නන් ව්‍යාපාරිකයන් මැණික් හා ස්වර්ණාභරණ නිපදවන්නන් මැණික් එකතු කරන්නන් ශිෂ්‍යයන් හා සාමාන්‍ය ජනතාවද විශාල වශයෙන් ඇදී එතැයි අපේක්ෂා කෙරේ.

වැඩි විස්තර සඳහා www.gemmology.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.